

මාක්ස්, ලෙනින්වාදී අන්තයෙන්ද, ලිබරල්වාදී අන්තයෙන්ද මිදී, දම්පල් තුමන් ගත් හෙළ බොදු මගට පිවිසි ලොකුසතු හේවා මෙත්තානන්ද හෙවත් එල්.එච්. මෙත්තානන්ද මහාසයාණෝ 1956 පෙබරවාරි 4දා අනඳ විදුහලේදී එළිදැක්වූ බෞද්ධ කමිටු වාර්තාව සඳහා අප්‍රමාණ මෙහෙවරක් කළහ. එසේම, එහි අධ්‍යාපනය සම්බන්ධ කොටසෙහි රචකයාණෝද වෙති. සිංහල බෞද්ධ අධ්‍යාපනය වෙනුවෙන් මහත් මෙහෙවරක් කළ එතුමාණෝ ක්‍රිස්තියානි මූලධර්මවාදයට හා දෙමළ බෙදුම්වාදයට එරෙහිව පැහැදිලි හඬක් හා වැඩපිළිවෙලක් ගොඩනැගූ ජාතික වීරයෙකි.!

# සිංහල බෞද්ධයාට කුඩම්මාගේ සැලකිලි

**පසුගිය** අවුරුදු දෙක තුළ 1954-1955 බෞද්ධ තොරතුරු පරීක්ෂක සභාව ලංකාවේ නොයෙක් පලාත්වලට ගොස් බෞද්ධයන් පිලිබඳ තොරතුරු විමසූ බව ඔබට මතක ඇත. ගිය හැම පලාත්වලම එකී සභාව හරසරින් පිළිගෙන බෞද්ධ ජනතාව තමන්ට සිදුවී තිබෙන දුක්ගැනවිලි කියා සිටියහ. ඉක්බිති එකී සභාව ඒ පිළිබද කළ යුතු දේ ද ගතයුතු නිගමනවල්ද සහිත විස්තර වාර්තාවක් පිළයෙල කොට ඒ වාර්තාව මහා සංඝයාට ඉදිරිපත් කළේය. මහා සංඝයා එය පිළිගෙන රජය මගින් එය ක්‍රියාත්මක කිරීමට ප්‍රතිඥා දුන්හ. පසුගිය මහා මැතිවරණයේදී එකී බෞද්ධ කොමිෂන් වාර්තාවේ නිගමනයන් ක්‍රියාත්මක කිරිමට මහජන එක්සත් පෙරමුණේ පක්ෂය පොරොන්දු දුන්හ. එම නිසා මහා සංඝයා එම පක්ෂයට ඡන්දය දෙන්නටයි මහජනයාට අනුශාසනා කළේය. ඒ අනුශාසනය අනුව මහජනයා පුදුම උනන්දුවක් දක්වමින් මහජන එක්සත් පෙරමුණට රාජ්‍ය බලය පවරා දුන්හ. එසේ කර දැන් මාස 07 ක් පසු විය. ආණ්ඩු පක්ෂය බෞද්ධයාට දුන් පොරොන්දු ඉෂ්ඨකරාවියයි හැම බෞද්ධයෙක්ම බලාපොරොත්තුව සිටි නමුත් බලාපොරොත්තුවෙන් පමනක් බෞද්ධ ඉරණම ඉටු නොවන්නේය. එබැවින් බලාපොරොත්තුව වහාම ක්‍රියාවට යොදවා ගැනිම අපගේ පරම යුතුකමකි. ඊට අප විසින් කලයුත්තේ ආණ්ඩු පක්ෂය දුන් පොරොන්දු ඉෂ්ඨ කරන තුරු රට පුරා උද්ඝෝෂණ කිරිමය. දැන් ඊට කාලය පැමිණ තිබේ. එවැනි උද්ඝෝෂණයකින් බෞද්ධයා නිවට නොවන බව ප්‍රකාශ කල යුතුයි. ආණ්ඩු පක්ෂය බලයට පැමිණියේ කුමක් හෙයින්දැයි වරින් වර පහදා දීම අණ්ඩුවටද කරන යහපතකි.

බෞද්ධ කොමිෂන් වාර්තාවේ ප්‍රධානම නිගමනය වන්නේ අධ්‍යාපනය පිළිබඳ නිගමනයයි. එනම් - ''1958 ජනවාරි 01 වෙනිදා වන විට ආධාර ලබන සියළුම පාඨශාලා රජයට බාරගත යුතුය'' යන්නයි. මේ නිගමනයට හේතු කවරේදැයි වාර්තාවේ සවිස්තරව සඳහන් කර ඇත. අද දවසේ බොහෝ බෞද්ධ ළමයින්ට යන්නට වී තිබෙන්නේ ක්‍රිස්තියානි පාසල් වලටයි. විශේෂ කතෝලික පාසල් වලටයි.

මේ බලන්න.

**විද්‍යල හෙවත් පළමුවැනි පන්තියේ පාසල්**

බෞද්ධ ළමයින් ................... 23757 ට
පාසල් ................. 01යි
ක්‍රිස්තු භක්තික ................... 5342 ට
පාසල් ................. 01යි

**ජ්‍යෙෂ්ඨ හෙවත් දෙවැනි පන්තියේ පාසල්**

බෞද්ධ ළමයින් ................... 74254 ට
පාසල් ................. 01යි
ක්‍රිස්තු භක්තික ................... 5342 ට
පාසල් ................. 01යි

**කණිෂ්ඨ විද්‍යල හෙවත් තෙවැනි පන්තියේ පාසල්**

බෞද්ධ ළමයින් ................... 35924 ට
පාසල් ................. 01යි
ක්‍රිස්තු භක්තික ................... 1239 ට
පාසල් ................. 01යි

**මෙයින් පෙනෙන්නේ**

01. ක්‍රිස්තු භක්තිකයන්ට බෞද්ධයින්ට වඩා 27 ගුණයක් විද්‍යල හෙවත් පළමු වැනි පන්තියේ පාසල් ඇති බවයි.
02. ක්‍රිස්තු භක්තිකයන්ට බෞද්ධයින්ට වඩා 14 ගුණයක් ජේෂ්ඨ හෙවත් දෙවනි පන්තියේ පාසල් ඇති බවයි.
03. ක්‍රිස්තු භක්තිකයන්ට බෞද්ධයින්ට වඩා 29 ගුණයක් කණිෂ්ඨ හෙවත් පළමු වැනි පන්තියේ පාසල් ඇති බවයි.

බෞද්ධ ළමයින්ට මෙසේ වෙනස්කම් ඇතිවූ යේ නමුදු නිදහස් අධ්‍යපනයට වියදම් රජයෙනි. බෞද්ධ ළමයින්ට ඇති වෙනස්කම සේම බෞද්ධ ගුරුවරුන්ටද වෙනස්කම් ඇතිවේ

1954 වර්ෂයේ පරිපාලන වාර්තාව අනුව එම වර්ෂයේ පුහුණුව ලැබූ ගුරුවරුන්ගේ මුළු ගණන 2509.මේ ගණනින් ක්‍රිස්තියානි හා ආණ්ඩුවේ අභ්‍යස විද්‍යාලවල පුහුණුව ලැබූ ක්‍රිස්තියානි ගුරුවරු 570 කි. මෙය ජනලේඛනය අනුව ඔවුන්ගේ සාධාරණ අයිතියට වඩා තුන්ගුණයකි. මේ අයුක්තිය නිසා දක්ෂ වු බෞද්ධ ගුරුවරු අයින් වේ. අදක්ෂ වු ක්‍රිස්තියානි ගුරුවරුන්ට ඉඩ ප්‍රස්තාව හිමි වේ. අභ්‍යස විද්‍යලය ප්‍රවේශ විභාග වලින් ලකුණු සියයට 50 ට වැඩියෙන් ලබා ගන්නා බෞද්ධ අයදුම් කරුවෝ 400 කට අධික ගණනක් අවුරුදු පතා සම්මුක පරීක්ෂණ වලට පවා නොකැඳවා ප්‍රතික්ෂේප කරණු ලැබෙත්. නමුත් සියයට 35-40 ලබාගත් ක්‍රිස්තියානි කතෝලික අයදුම්කරුවෝ අභ්‍යස විද්‍යල වලට ඇතුලත් කරගනිති. ගුරුවරුන් පුහුණු කිරිම සඳහා සම්පූර්ණ වියදම් දරණු ලබන්නේ රජය විසිනි.

**බෞද්ධ ළමයින්ට වැඩිපුර ඇත්තේ පිටිසරබඳ පාසල්ය.**

ක්‍රිස්තු භක්තික ළමයින්ට වැඩියෙන් ඇත්තේ නගරබඳ පාසල්ය.

ඒවායේ වෙනස් කම් මෙසේය.

පිටිසරබඳ පාසලක එක ළමයෙකුට මසකට ආණ්ඩුව දරණ වියදම.......... රු.2.33 යි.

නගරබඳ පාසලක එක ළමයෙකුට මසකට ආණ්ඩුව දරණ වියදම........... රු.5.83 යි.

රාජකීය පාසලක එක ළමයෙකුට මසකට ආණ්ඩුව දරණ වියදම .........රු.34.40 යි.

තවද රජය අධ්‍යාපනය උදෙසා කරන වියදමින් සියයට අසුවක් ක්‍රිස්තියානි පක්ෂයට ගෙවති. එසේ වුවත් ක්‍රිස්තියානි පක්ෂය ජනගහනයෙන් සියයට නමයක් පමණකි.

විශ්ව විද්‍යලයේ බෞද්ධයින්ට වඳින්නට සිදුවී තිබෙන වෙනස්කම් ඉතාම උග්‍රයි.

1953 අවුරුද්දේ විශ්ව විද්‍යාලයේ ශිෂ්‍ය සංඛ්‍යාව ......... 2392 යි. එයින්,
බෞද්ධයන් .......... 1094
හිනිදූන් .......... 574
ක්‍රිස්තියානින් .............. 666

ජනගහනය අනුව බෞද්ධයන්ට සරිලන ගණනට අඩුව සියයට ........ 31 යි.
ජනගහනය අනුව හින්දුන්ට සරිලන ගණනට වැඩිය සියයට ........ 21 යි.
ජනගහනය අනුව ක්‍රිස්තියානීන්ට සරිලන ගණනට වැඩිය සියයට ........ 217 යි

තවද 1954 වර්ෂයේදී නවීන විද්‍යා අංශයට ඇතුළත් කරගෙන ඇත්තේ සිංහල 142, දෙමළ 145

1955 වර්ෂයේදී ඉංජිනේරු අංශයට ඇතුළත් කරගෙන ඇත්තේ සිංහල 4 දෙමළ 23 කි.

විශ්ව විද්‍යාලයේ වෙනස්කම් පාලක මණ්ඩලවලදිද හොඳාකාර පෙනේ. ඒ මෙසේය.

විශ්ව විද්‍යාලීය මණ්ඩලයේ සාමාජික ගණන 18 කි. මෙයින් බෞද්ධයන් 4, ක්‍රිස්තියානීන් 13 කි.

විශ්ව විද්‍යාලීය සැනෙට් සභාවේ සාමාජික ගණන 54 කි. මෙයින් බෞද්ධයන් 15 ක්‍රිස්තියානීන් 54 කි.

විශ්ව විද්‍යාලීය කෝට් සභාවේ සාමාජික ගණන 96 කි. මෙයින් බෞද්ධයන් 30 ක්‍රිස්තියානීන් 55 කි.

මේ අධ්‍යාපනික වෙනස්කම් නිසා බෞද්ධයා පහත් තත්ත්වයක වැටී සිටී. අධ්‍යාපනය යම්සේද දිවයිනේ සෑම කටයුත්තක්ම එසේමය. පරිපාලන යන්ත්‍රය එළවන්නේ අධ්‍යාපනයයි. එමනිසා බෞද්ධයාගේ 'ජනගහනය සියයට හැත්.ෑ දෙකක් වූයේ නමුත් රජයේ සේවාවල තනතුරු බෞද්ධයින්ට සියයට විස්සක්වත් නැත. එසේම වෙළදාමේ වතු පිටි හෙවත් ආර්ථික බලයෙන්ද සියයට අසූවක් ඇත්තේ සුළුවර්ගයිටයි. මේ පරිපාලන යන්ත්‍රය යටත් විජිත ක්‍රමයයි. මේආර්ථික තන්ත්‍රයද යටත් විජිත ක්‍රමයයි. මෙයාකිර යටත්විජිත ක්‍රමයක් පරිපාලන යන්ත්‍රයේද ආර්ථික තන්ත්‍රයේද රඳවා ගැනීම ට හැකිවී තිබෙන්නේ යටත් විජිත අධ්‍යාපන ක්‍රමය නිසාය.

අප රට ප්‍රජාතන්ත්‍රවාදයට තවම හැඩගැසී නැත. බහුජනතාව මැඩගෙන සුළු වර්ගයාට ඉහළ තැනක් දීම යටත් විජිත ක්‍රමයකි. මෙය පවත්වාගෙන යාමට ඉංග්‍රීසි අධිරාජ්‍යට සහය ලැබුණේ මිෂනාරීවරුන්ගෙන්ය. ආණ්ඩුවේ රාජකාරියට සුදුස්සන් යයි පිළිගත්තේ මිෂනාරී පාසල් වල ඉගෙනීම ලැබූ උදවියයි. ක්‍රිස්තියානි ආගමට ගිය උදවියයි. ඔවුන්. සුදුසු වූයේ මෙරට ජනතාවගෙන් ඈත්වුණු නිසාත් විදේශී තාලයට නටන නිසාත්ය. මාෂනාරී පාසල් පිහිටුවීමට අරමුණ දෙකක් විය. පළමුව බෞද්ධ දරුවා ක්‍රිස්තියානි කිරීමටත් එය නුපුළුවන් වුණොත් බෞද්ධ දරුවා නරක බෞද්ධයෙක් කිරීමටත්ය. එමනිසා සිංහලයන් ද්‍රවිඩයන් අතුරෙන් සිංහලයන්ට වඩා ද්‍රවිඩයන්ට බලතල සත්කාර සම්මාන ලැබිණ. හැම අතින්ම නිවට බවට පත්වූයේ සිංහල බෞද්ධයායි. සිංහල බෞද්ධයාට විදේශී ආණ්ඩු කළ වෙනස්කම් ගැන අවංක විදේශී නිලාරීන්ද අවංක මිෂනාරීවරුන්ද පවා පෙන්වා දුන්හ. මහජනයාගෙන් රජය ලබාගන්නා ආදායම ඔවුන්ගේ ආගම වෙනස්නකිරීමට අන්‍යාගමිකයින්ට දීම බලවත් අසාධාරණයකයැයි තරයේ ඒ උතුමෝ කියාසිටියහ. නමුත් බෞද්ධයින්ගේ අධ්‍යාපනය ගෙනයෑට මිෂනාවීවරුන්ට ඔවුන්ගෙන්ම ලබන මුදල් දීම විදේශී ආණ්ඩුව නතරකළේ නැත. ලංකාවට නිදහස ලැබුනායින් පසුවත් මේ අයුතු ක්‍රමය වෙනස් නොකළේය. ඊට ප්‍රධාන හේතුව කපටි ඉංග්‍රීසීන්ට ඕනෑකළේ ඔවුන්ට මෙරටින් ලැබුණු වාසි පසුවටත් ලබාගැනීමට හැකිවන පරිදි ඔවුන්ට විශ්වාස වූ උදවිය අතට ආණ්ඩු බලයපැවරීමය. මාෂනාරීන් විසින් තෙම්පරාදු කරපු අයවලුන් කෙරෙහි ඔවුන්ගේ තද විශ්වාසය පවතිණ. එමනිසා අද වෙනතුරු පරිපාලන බලය ඇත්තේ මිෂනාරීන් පුරුදු පුහුණු කළ උදවියටයි. කවුද ඒ උදවිය? සියරට ජනතාවගෙන් ඈත්වූ විදේශීන්ට පන්දම් අල්ලන ජාතිද්‍රෝහී පිරිසකටය.

මොවුන් යටත්විජිත අධ්‍යාපනන ක්‍රමය වෙනස් කරනවාට කැමති නැත. මිෂනාරීන් ජාතික සභ්‍යත්වයට හිත අය ජාතික භාෂාවට හිත අය දේශානුරාගයෙන් පාරි ඇත. මහජනයාට ඇල්මක් ඇත. වාම් ජීවිතයට ප්‍රිය කරති. මිෂනාරීන් තෙම්පාරාදු කරපු උදවිය අලජ්ජී කාමරයෙහි අදූරදර්ශී පිරිසයි. එය අල්ලස් වසංගතයෙන්ද රජයේ සමූපාකාර සමිතිවල හොරකම්වලින් රජයේ කර්මාන්තශාලා කාඩාකප්පල් වීමෙන් රජයේ සේවාවල දූෂණ වැඩ වලින් මනාව ඔප්පු වේ.

**ලබන කලාපයට..**